# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1988/4 - 2016 ඔක්තෝබර් මස 10 වැනි සඳුදා - 2016.10.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට ආසියානු සංවර්ධන බැංකු සහයක මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩ සටහන යටතේ ඉදිකිරීමට යෝජිත බූස්ටර් පොම්පාගාරයට ප්‍රවේශ මාර්ගයක් ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක පරවශතා අයිතිය අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි පරවශතා අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,<br>
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 ඔක්තෝබර් මස 04 වැනි දින,<br>
අංක 35, "ලක්දිය මැඳුර",<br>
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,<br>
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.<br>
5/2/2/1243

### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 514A වැලිකඩ, බටහිර ග්‍රාම නිලධාරී වසමේ වැලිකඩ ගමේ පිහිටි මිල්ලගහවත්ත නමැති ඉඩම පෙන්නුම් කෙරෙන බලයලත් මිනින්දෝරු ජී. අබේගුණවර්ධන මිය විසින් පිළියෙල කර ඇති අංක 2015/W09 දරන පිඹුරේ කැබලි අංක 2 ලෙස දැක්වෙන සම්පූර්ණ ප්‍රමාණයෙන් හෙක්. 0.0214 (පර්චස් 8.5)ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

*උතුරට* : මෙම සැලැස්මේ කැබලි අංක 01 සහ බලයලත් මිනින්දෝරු සිරි ඩී. ලියනසූරිය විසින් පිළියෙල කරන ලද අංක 2138 පිඹුරේ කැබලි අක්ෂර $C^1$, B හා කැබලි අක්ෂර A ලෙස පෙන්නුම් කරන ඉඩම් කොටස් ;

*නැගෙනහිරට* : රාජගිරිය පාර සහ බලයලත් මිනින්දෝරු සිරි ඩී. ලියනසූරිය විසින් පිළියෙල කරන ලද අංක 2138 පිඹුරේ කැබලි අක්ෂර $C^1$, B සහ කැබලි අක්ෂර A යන ඉඩම් කැබලි ;

*දකුණට* : වරිපනම් අංක 215 දරන පරිශ්‍රය ;

*බටහිරට* : රාජගිරිය පාර, මෙම සැලැස්මේ කැබලි අංක 1 සහ වරිපනම් අංක 215 දරන පරිශ්‍රය.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : නොදනී.

10 -1269

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට යාපනය කිලිනොච්චිය ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය යටතේ තිරුනගර් මලාපවහන පොම්පාගාර අංක 09 හා ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 ඔක්තෝබර් මස 04 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/3/1218

**උපලේඛනය**

යාපනය දිස්ත්‍රික්කයේ, යාපනය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක J/75, වුන්ඩ්කුලි දකුණ ග්‍රාම නිලධාරී වසමේ තිරුනගර් පස්සායියූර් ගමේ පිහිටි යාපනය මහනගර සභාව හිමිකම් කියන ඉඩමෙන් 6m x 6m ක් පමණ පෙන්නුම් කෙරෙන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස ඃ

*උතුරට* : ආචාර්ය බැස්ටියම්පිල්ලෙයි ඩියෝගුපිල්ලෙයි පියතුමා හිමිකම් කියන ඉඩම ;

*නැගෙනහිරට* : භාරති ප්‍රජා ක්‍රීඩාංගනය ;

*දකුණට* : එම ඉඩමේ ඉතිරි කොටස ;

*බටහිරට* : එම ඉඩමේ ඉතිරි කොටස හා ප්‍රවේශ මාර්ගය.

*ඉඩමට හිමිකම් කියන්නාගේ නම සහ ලිපිනය* : 01. මහනගර සභාව,
යාපනය.

10 -1270

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට යාපනය කිලිනොච්චිය ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය යටතේ පුන්ගුඩුතිව් ජල කුළුණට ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 ඔක්තෝබර් මස 04 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/3/1222

උපලේඛනය

යාපනය දිස්ත්‍රික්කයේ, වෙලනෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක J/30, පුන්ගුඩුතිව් මධ්‍යම බටහිර ග්‍රාම නිලධාරී වසමේ පුන්ගුඩුතිව් ගමේ පිහිටි අලි එලුවන් කලඩු වත්ත නැමති ඉඩමෙන් 4m x 85m ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | ප්‍රධාන මාර්ගය ; |
| *නැගෙනහිරට* | : | අලි එලුවන් කලඩු වත්ත ; |
| *දකුණට* | : | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අත්කර ගන්නා ලද ඉඩම ; |
| *බටහිරට* | : | අලි එලුවන් කලඩු වත්ත. |

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනය :* සිවසාන්ති තිරුනාවක්කරසු මහතා සහ එස්. මහේෂ්වරී මහත්මිය,
උපතිස්ස පාර,
කොළඹ 04.

10 -1271

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.